# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2095/42 – 2018 නොවැම්බර් 01 වැනි බ්‍රහස්පතින්දා – 2018.11.01

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2016/78.

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2017.11.09 දිනැති හා අංක 2044/38 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.10.30 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රත්නපුර, හිදැල්ලන, කුරුඳුවත්ත හි පදිංචි වයි. ආර්. කමනි හසන්ති මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුල පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.09.11 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ඔක්තෝබර් මස 22 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

මගේ අංකය: IR/COM/03/2016/78.

**කාර්මික අධිකරණයේ දී ය.**

වයි. ආර්. කමනී හසන්ති මිය,
කුරුඳුවත්ත,
හිදැල්ලන,
රත්නපුරය.

*ඉල්ලුම්කරු*

නඩු අංකය: ඒ/38/2017.

*සහ*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක. 200,
කිරුල පාර,
කොළඹ 05.

*වගඋත්තරකරු*

**ප්‍රදානයයි**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර කාර්මික ආරාවුලක් පවත්නා හෙයින් කම්කරු වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වෙලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමන් විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් එතුමා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2017. 10. 30 දිනැති නියෝගයෙන් මා පත්කර මා වෙත යොමුකර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ඉල්ලුම්කාර වයි. ආර්. කමනි හසන්ති නැමැත්තියට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් 2015.07.06 දින ලිපිකරු පත්වීමක් ලබා දී, එම පත්වීම 2015 මහමැතිවරණ ප්‍රකාශයට පත් කිරීම හේතු කොට ගෙන මැතිවරණ කොමසාරිස් විසින් නිකුත් කළ චක්‍රලේඛයන්ට අනුව 2015.07.14 පත්වීම අවලංගු කොට ඇගේ රැකියාව අහිමිකොට ඇත. නමුත් ඒ හා සමානවම පත්වීම ලබා දුන් රියදුරු කොන්දොස්තර කාණ්ඩයන්හි පත්වීම් ස්ථිර කොට ඇත. ඒ අනුව මෙම ඉල්ලුම්කාරියට තම රැකියාව අහිමි කිරීම සම්බන්ධව අසාධාරණයක් සිදු වී ඇත්ද යන්න හා එසේනම් ඇයට හිමි විය යුතු සහන කවරේද" යන්න පිළිබඳව වේ.

කම්කරු කොමසාරිස් ජනරාල් (වැඩබලන) මේ ලියවිල්ලට 2017 ඔක්තෝබර් මස 10 වැනි දින අත්සන යොදා ඇත. බේරුම්කරණය වෙත භාර දෙන ලද 2018.03.13 වෙනි දින ඉහත කී ප්‍රකාශයට ඇය වෙනුවෙන් නීතිඥ ජානක රත්නායක මහතා ද අත්සන් කොට ඇත.

එසේ වුවද 2018. 04. 17 දින මෙම නඩුව කැඳ වූ අවස්ථාවේදී පැමිණිලිකාරිය හෝ ඇය වෙනුවෙන් කිසිම නීතිඥවරයෙකු පැමිණ නොසිටි බැවින් මෙම පරීක්ෂණය මවිසින් 2018.05.24 දිනට යොදා ගන්නා ලදී. එදින කිසිම හේතුවක් දක්වන්නේ නැතිව පැමිණිලිකාරිය හෝ ඇයගේ නීතිඥ ජානක රත්නායක මහතා හෝ වෙනත් නීතිඥවරයෙකු පැමිණ නොසිටි බැවින් පැමිණිලිකාරියට තවත් අවස්ථාවක් ලබාදෙනු වස් පරීක්ෂණය 2018.08.02 දින ප.ව. 2.45 ට කැඳවීමට නියම කරන ලදී. එදින ද පැමිණිලිකාරිය හෝ ඇය වෙනුවෙන් නීතිඥවරයෙකු පැමිණ නොසිටි බැවින් මෙම පරීක්ෂණය අවසාන වශයෙන් 2018.08.29 පෙ.ව.10.00ට වගඋත්තරකාර පාර්ශ්වයේ ඉල්ලීම නොතකා පරීක්ෂණය 2018.09.11 දිනට ද නියම කරන ලදී. එදිනද ඉල්ලුම්කාරිය හෝ ඇය වෙනුවෙන් නීතිඥවරයෙකු හෝ නියෝජිතයකු පැමිණ නොසිටි බැවින් පරීක්ෂණය නිෂ්ප්‍රභ කොට ඒ බව පැමිණිල්ල මෙහෙයවීමේ පාර්ශවය වන වයි. ආර්. කමනි හසන්ති මහත්මියට දැනුම් දෙමින් මෙම පරීක්ෂණය අවසන් කරන ලදී.

**නීතිඥ ටී. පියසෝම,**
බේරුම්කරු.

2018 සැප්තැම්බර් මස 11 වැනි දින දීය.

11- 686

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.